# වැඩිහිටි සත්කාර සේවාවන් තෝරා ගැනීම

වැඩිහිටි සත්කාර සේවා වර්ග ගණනාවක් ඇති නමුදු ඔබට හෝ ඔබේ  පවුලේ සමාජිකයාට ලබාගත හැක්කේ කෙබඳු විකල්පයක්ද යන්න තෝරා ගැනීම අවුල් සහගත දෙයක් වන්නට ඉඩ ඇත. මෙහි  සඳහන් තොරතුරු අතර කිනම් සේවාවෙන් ලබාගත හැකිද යන්න සහ ඒවා වෙත ප්‍රවිශ්ඨ වන්නේ කෙසේද යන තොරතුරු සහ වැදගත් දුරකථන අංක කිහිපයක්ද ඇත. මෙය රජය මගින් සහන සනසන වැඩිහිටි සත්කාර සේවාවන් තුන් වර්ගයක් පිළිබඳ විස්තර කරයි

- **ප්‍රජා සත්කාර (Community Care)**
- **විවේක කාල සත්කාර (Respite Care)**
- **නේවාසික සත්කාර (Residential Care)**

ඔබට මේ සේවාවන් දැනට අනවශ්‍ය වුවද  ඉදිරියේ දී ඇතිවන සත්කාර අවශ්‍යතා සඳහා සුදානම් වනු වස්ල ලබාගත හැක්කේ මොනවාද යන්න දැනගැනීම වැදගත් වේග

### ප්‍රජා සත්කාර (Community Care)

වියපත් අය වැඩිදෙනෙකු  සිය නිවසේම තවදුරටත් දිවි ගෙවීමට රිසි නමුදු   සහයකින් තොරව එසේ සිටීම අසීරු කරුණක් වනු ඇත. සිය නිවසේම
වියපත්වුවන්ට දිවි ගෙවීමට ආධාර වන වැඩිහිටි සත්කාර සේවා ගණනාවක් ඇත.  මේ වර්ගයට අයත් සත්කාරයන් ප්‍රජා සත්කාර ලෙස හැඳින්වෙන අතර ඔබේ අවශ්‍යතා පරිදි එකිනෙකට වෙනස් වර්ගයන් හතරක් ඇත.

### නිවාස සහ ප්‍රජා සත්කාර (Home and Community Care - HACC)

නිවාස සහ ප්‍රජා සත්කාරයන්  එදිනෙදා කටයුතු මනා අයුරින් පාලනය කරගැනීමේදී දුෂ්කරතාවයන් අත්දකින එසේම තම නිවසේ ස්වාධීනව ජීවත් වීමට බලාපොරොත්තු වන දුබල වයස්ගත අය සඳහා මුලික ආධාර සේවාවන් සපයයි. හෙද සහ සහායක සෞඛ්‍ය සේවාවන් පුද්ගලික සත්කාර (නෑම, ඇඳුම් ඇඳ ගැනීම සහ ආහාරගැනීම) දුෂ්කර පළාත් වලට සැපයෙන ආහාරසේවා සහ අනෙකුත් ආහාර සේවාවන්, නිවසේදී සමහර ආධාර (ගෙදර දොරේ වැඩට ආධාර කිරීම රෙදි සේදීම, සාප්පු යාම) නිවසේ ආකෘතිමය වෙනස් කම් කිරීම සහ නඩත්තුව, ගමනාගමනය උපදේශනය සහ සමාජයීය සහය යන සේවාවන් මීට අයත් වේ. සාත්තු නිවාස සහ ප්‍රජා සත්කාරයන් ප්‍රාදේශී සභා ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන සහ ප්‍රජා සංවිධානයන් මගින් සාමාන්‍යයෙන් සපයනු ලැබේ.

### ප්‍රජා වැඩිහිටි සත්කාර පැකේජයන් (Community Aged Care Packages - CACP)

ප්‍රජා වැඩිහිටි සත්කාර පැකේජයන් නිවසේ දිවිගෙවීම සඳහා වැඩිහිටි,
සංකීර්ණ සත්කාර අවශ්‍යතා ඇති දුබල වයස්ගත අය සඳහා පුලුල් පරාසයක පවතින සේවා සපයති. මෙකී සේවා පැකේජයන් සුනම්‍ය වන අතර පුද්ගලික අවශ්‍යතාවනට සරිලන අන්දමට සකස් කර ඇතිවා සේම පුද්ගලික සත්කාර (නෑම,  ඇඳුම් ඇඳ ගැනීම සහ ආහාරගැනීම) ආහාර පිළියෙල කිරීම,  නිවසේදී සමහර ආධාර (ගෙදර දොරේ වැඩට ආධාර කිරීම,  රෙදි සේදීම,  සාප්පු යාම) ගමනාගමනය සහ සමාජයීය සහයයන් ඇතුලත් විය හැක. මෙකී සේවාවන් සැලසුම්කර සම්බන්ධීකරණය සිද්ධ කරනු ලබන්නේ අනුමත වැඩිහිටි සත්කාර සේවා සැපයුම් කරුවන් විසිනි. ප්‍රජා වැඩිහිටි සත්කාර පැකේජයන් ලබා ගැනීම සඳහා සුදුසුකම් ඇතිද යන්න තීරණය කරනු ලබන්නේ වැඩිහිටි සත්කාර තක්සේරු කණ්ඩායමක් Aged Care Assessment Team (3 වැනි පිට බලන්න) මගිනි.

## නිවෙස තුල ලැබෙන වැඩිදුර වැඩිහිටි සත්කාර (Extended Aged Care at Home Packages - EACH)

ප්‍රජා වැඩිහිටි සත්කාර පැකේජයන් සේවාවන් විසින් වඩා වැඩි සහයයන් අවශ්‍ය අය සඳහා නිවෙස තුල ලැබෙන වැඩිදුර වැඩිහිටි සත්කාර පැකේජයන් සපයනු ලබති. මෙකී සේවා පැකේජයන් සුනම්‍ය වන අතර පුද්ගලික අවශ්‍යතා සපුරාලනු වස් සැලසුම් කර ඇතිවා සේම හෙද සහ සහායක සෞඛ්‍ය සේවාවන් පුද්ගලික සත්කාර (නෑම, ඇඳුම් ඇඳගැනීම සහ ආහාර ගැනීම සඳහා සහය නිවෙස් ආධාර, ගෙදරදොරේ වැඩ, රෙදි සේදීම සහ සාප්පු යාම) ගමනාගමනය සහ සමාජ සහයන් යනාදිය ඇතුලත් වේ. මෙකී සේවාවන් අනුමත වැඩිහිටි සත්කාර සේවා සැපයුම්කරුවන් විසින් සැලසුම් කොට සම්බන්ධීකරණය සිදු කරනු ලබති. නිවෙස තුල ලැබෙන වැඩිදුර වැඩිහිටි සත්කාර සඳහා සුදුසුකම් ඇතිද යන්න තීරණය කරනුයේ වැඩිහිටි සත්කාර තක්සේරු කණ්ඩායමක් මගිනි. (3 වැනි පිට බලන්න)

## නිවෙස තුල ලැබෙන වැඩිදුර වැඩිහිටි සත්කාර පැකේජයන් - චිත්ත වික්ෂේපය (Extended Aged Care at Home Packagers  Dementia – EACH D)

නිවෙස තුල ලැබෙන වැඩිදුර වැඩිහිටි සත්කාර - චිත්ත වික්ෂේප පැකේජය විසින් සහය සලසනුයේ චිත්ත වික්ෂේපය නිසා පීඩා විඳමින් දිවිගෙවන පුද්ගලයින්ටයි. මෙකී සේවා පැකේජයන් සුනම්‍ය වන අතර පුද්ගලික අවශ්‍යතා සපුරාලනු සඳහා සැලසුම් කර ඇතිවාසේම හෙද සහ සහායක සෞඛ්‍ය සේවාවන් පුද්ගලික සත්කාර (නෑම, ඇඳුම් ඇඳීම සහ ආහාර ගැනීම) සමහර ආධාර (ගෙදර දොර වැඩ, රෙදි සේදීම  සහ සාප්පු යාම) ගමනාගමනය සහ සමාජයීය සහය සපයති. මෙකී සේවාවන් සැලසුම්කොට සම්බන්ධීකරණ සිදු කරනුයේ අනුමත වැඩිහිටි සත්කාර සේවා සැපයුම්කරුවන් විසිනි. නිවෙස තුල ලැබෙන වැඩිදුර වැඩිහිටි සත්කාර - චිත්ත වික්ෂේපය තීරණය කරනු ලබන්නේ වැඩිහිටි සත්කාර තක්සේරු කණ්ඩායමක් මගිනි. (3 වැනි පිට බලන්න)

ප්‍රජා සත්කාර පිළිබඳව සහ ඔබ අවශ්‍යතාවන්ට සරිලන සේවාවන් පිළිබඳ වැඩි විස්තර ලබාගැනීම සඳහා දුරකථන අංක **1800 052 222** මගින් **රජයේ සත්කාර ක්‍රියාදාම මධ්‍යස්ථානය Commonwealth Carelink Centre** අමතන්න.

## විවේක කාල සත්කාර (Respite Care)

විවේක කාල සත්කාර යනු කෙටිකාලීන සත්කාර සේවයක් වන අතර එය
වියපත් තැනැත්තන්ට සහ ඔවුන්ගේ සත්කාරකයන්ට සිය එදිනෙදා ජීවන රටාවෙන් මදකට මිදීමට අවස්ථාවක් ලබාදේ. වියපත් අයගෙන් වැඩිදෙනෙකු සිය පවුලේ සමාජිකයකු විසින් රැකබලා ගනු ලැබේ. සත්කාරයකයන්ගේ අගනා කරතව්‍යයට සහය පළකිරීම වැදගත් වීමට තවත් හේතුවක් වන්නේ සත්කාරකයින් වැඩිදෙනෙකු ද වියපත් අය බැවිනි. විවේක කාල සත්කාර එදිනෙදා ජිවිතයෙන් විරාමයක් ලබාගැනීමට සත්කාරකයාහට සිය සත්කාර වගකීම් වලින් මදකට මිදීමට සහාය වන අතර වියපත් තැනැත්තාට නිවසේ රැඳීමටද ආධාර කරයි. විවේක කාල සත්කාරයන් වියපත් තැනැත්තාට හට තාවකාලික සත්කාර සේවාවන් සපයන අතරම එය සත්කාරකයාට විවේක ගැනීමට අනෙකුත් වගකීම් පිළිබඳ කටයුතු කිරීමට සහයවේ (උදා: සාප්පු යෑම) හෝ නිවාඩුවක් ලබාගැනීමට අවස්ථාවක් ලබාදේ. මෙය සාමාන්‍යයෙන් කලින් සැලසුම් කළයුත්තක් වන නමුදු හදිසි අවස්ථාවක් සඳහාද බලාගත හැකිය. (උදා: සත්කාරක අසනීප වුවිටක) හුදෙකලාව ස්වාධීනව දිවි ගෙවන සහ තමාගේ කටයුතු තනිවම කරගැනීම අපහසු යැයි සිතන සහ විවේකයක් ලබාගැනීමට අවශ්‍යයැයි සිතන වියපත් වුවන්ටද විවේක කාලය සත්කාර ලබාගත හැකිය. එකී සේවාවන් වියපත්වුවන්ගේ නිවෙස් තුල දිවා සුව සත්කාර මධ්‍යස්ථානයක් හෝ නේවාසික සත්කාර ඒකකයන් තුලදී ලබාදෙනු ලැබේ. විවේක කාල සත්කාර සාත්තු නිවාස සහ ප්‍රජා සත්කාර සත්කාරකයින්  සඳහා විවේක පිළිබඳ ජාතික වැඩසටහන සහ නේවාසික සත්කාර මගින් සපයනු ලැබේ. සුදුසුකම් ලැබීම, ප්‍රමුඛත්වය සහ අවශ්‍යතාව මත විවේක කාල සත්කාර ලබාගත හැකිය.

සත්කාරකයන් සඳහ විවේක කාල සත්කාර සහ අනෙකුත් ආධාර සේවාවන් පිළිබඳ වැඩිදුර විස්තර සඳහා දුරකථන මගින් රජයේ සත්කාරක විවේක මධ්‍යස්ථානය දුරකථන අංක 1800 059 059 මගින් Commonwealth Carers’ Respite  Centre අමතන්න.

### නේවාසික සත්කාර (Residential Care)

වියපත් තැනැත්තකුගේ දුබලතා මට්ටම ඉහලයද්දී සිය නිවසේ තවදුරටත් දිවි ගෙවීම විකල්පයක් නොවනු ඇති අතර වැඩිහිටි සාත්තු නිවාසයක පිහිට පැතීම අවශ්‍ය වනු ඇත. වැඩිහිටි සත්කාර නිවාසයන් නේවාසික සත්කාර ඒකක ලෙසද හැඳින්වේ. නේවාසික සත්කාරයන් වරග දෙකකි: පහත මට්ටමේ සත්කාර සහ ඉහළ මට්ටමේ සත්කාර. මෙකී මට්ටම් දෙවරගයම නවාතැන්, මූලික ගෘහ භාණ්ඩ සැපයීම, රෙදි සේදීම, පිරිසිදු කිරීම, ආහාර වේල් සහ ප්‍රබෝධක ආහාර දිවා රෑ කාරය මණ්ඩලයන්, පුද්ගලික සත්කාර (නෑම, ඇඳුම් ඇඳ ගැනීම සහ ආහාර ගැනීම) නිතිපතා නොවන හෙද සත්කාර සහ සමාජ ක්‍රියාකාරකම් අතුළු පුළුල් පරාසයක පවතින සේවා සපයති. ඉහළ මටමේ සත්කාරයන් 24 පැය සහාය සහ දිගට පවත්නා හෙද සත්කාර අවශ්‍ය දුබල වයස්ගත පුද්ගලයින් සඳහා සහ සමහරක් වැඩිහිටි සාත්තු නිවාසයන් පහත මටමේ සත්කාර සහ ඉහළ මටමේ සත්කාර යන දෙවරගයම සපයමින් වයස්ගත පුද්ගලයන්ට සිය සත්කාර අවශ්‍යතා වෙනස් කිරීමත් අවශ්‍ය වුවද නිවස තුලම වියපත් වීමට අවස්ථාවන් ලබාදේ. වැඩිහිටි සත්කාර සාත්තු නිවාසයන් පවත්තාවාගෙන යනු ලබන්නේ අනුමත වැඩිහිටි සත්කාර සැපයුම්කරුවන් මගිනි නේවාසික සත්කාර සඳහා තීරණය කරනු ලබන්නේ Aged Care Assessment Team මගිනි. (3 වැනි පිට බලන්න)

නේවාසික සත්කාර පිළිබඳ වැඩි විස්තර සහ ඔබේ අවශ්‍යතාවනට සරිලන සාත්තු නිවාසයන් සොයාගැනීම සඳහා දුරකථන අංක **1800 052 222** මගින් **Commonwealth Care Link Centre** හෝ දුරකථන අංක **1800 500 853** මගින් **Aged Care Information Line** අමතන්න.

# අමතර තොරතුරු

### වැඩිහිටි සත්කාර තක්සේරු කණ්ඩායම (Aged Care Assessment Team - ACAT)

රාජ්‍ය අනුග්‍රහය ලබන වැඩිහිටි සත්කාර සේවා ලබාගැනීමේ පළමු පියවර වන්නේ වැඩිහිටි සත්කාර තක්සේරු කණ්ඩායමක් මගින් තක්සේරුවක් ලබා ගැනීමයි. ප්‍රජා වැඩිහිටි සත්කාර පැකේජයන් නිවසේදී වැඩදුර වැඩිහිටි සත්කාර පැකේජයන් සහ නේවාසික සත්කාර සඳහා යෝග්‍යතාවය පුද්ගලයකුගේ අවශ්‍යතා තීරණය කරන්නාවූ තක්සේරුවන් මගින් තීන්දු කරනුලැබේ. මෙය නොමිලේ සැපයෙන සහ රහසිගත සේවයක් වන අතර එතරම් භාරධූර ක්‍රියාවලියක්ද නොවේ. නියෝජිතයකු (සාමාන්‍යයෙන් වෛද්‍යවරයකු හෙද/හෙදියකු සමාජ සේවකයකු හෝ අනෙකුත් සුව සෞඛ්‍ය වෘත්තියෙකු) ඔබේ තත්වය සහ විශේෂිත අවශ්‍යතා තක්සේරු කරනු ඇත. ඔබ සුදුසුකම් ලබන සේවා මොනවාද යන්න සහ එකී සේවාවන් ලබාගත හැකි අයුරු ඔබ වෙත දැනුම් දෙනු ඇත. ඔබේ අවශ්‍යතා තක්සේරු කරන අවස්ථාවට ඔබේ ඥාතියකු හෝ යහළුවකු සහභාගිකර ගැනීමට ඔබට හැකිය. භාෂණපරිවර්තකයකු වෙතින් ඉල්ලා සිටීමට ඔබට අයිතියක් ඇත. තක්සේරු ප්‍රතිඵලය ගැන ඔබ සෑහීමකට පත් නොවන්නේ නම් එයට එරෙහිව අභියාචනය කිරීමට ඔබට අයිතියක් ඇත.තක්සේරුවක් පිළියෙල කරගනුවස් පවුලේ වෛද්‍යවරයා වෙතින් විශේෂඥ උපදෙස් සඳහා ලිපියක් ලබාගැනීමට හෝ Commonwealth Carelink Centre වෙත 1800 052 222 අංකයට කථා කළ හැකිය.

## වියදම් සහ ගාස්තු

පුද්ගලයන්ගේ සත්කාර අවශ්‍යතා තක්සේරුව සහ ඔවුන්ගේ ගෙවීමට ඇති හැකියාව මත වැඩිහිටි සත්කාර සේවා ලබාගැනීමේ මුදල තීරණය වේ. මූල්‍යමය වශයෙන් දුරවල තත්වයක පසුවන අය සඳහා විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. ඔබට ගෙවීමට නොහැකි වීම නිසා යම් සේවයක් අහිමි නොවන බව දැනගැනීම ඉතා වැදගත්ය. සියළු අයට සමාන සත්කාර ලැබීම සඳහා ගෙවනු ලබන මුදල් මට්ටමට අදාල නොවේ. වියදම් සහ ගාස්තු පිළිබඳ වැඩි විස්තර ලබා ගැනීම සඳහා දුරකථන අංක 1800 500 853 මගින් Aged and Community Care Information Line අමතන්න.

Options in Aged Care - Sinhalese

**ඔබේ අයිතීන් සහ වගකීම්**

ඔබ ලබන්නාවූ සේවාවන්  පිළිබඳ හා අයිතීන් සහ වගකීම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩිහිටි සත්කාර සේවා සැපයුම්කරුවන් බැඳී සිටිති.  ඔබ නේවාසික සත්කාර හෝ ප්‍රජා සත්කාර ලැබුවද පහත සඳහන් අයිතීන් පිළිබඳ දැනසිටීම ඉතා වැදගත් වේ:

- අයිතීන් පිළිබඳව දැනසිටීම;
- ලබන සත්කාර පිළිබඳ සියළු තීරණයන් සඳහා ඔබ සහභාගී වීම;
- ඔබ ජීවිතය, ඔබ සතු මුදල් සහ ඔබ සතු දෑ පාලනය කිරීමට ඔබට ඇති හැකියාව;
- උදාරව සහ ගෞරවපූර්වකව සැලකුම් ලැබීම;
- අසාධාරණයකින් තොරව ඔහට අදාල සංස්කෘතිය හෝ ආගමික වතාවත් පුරුදු පුහුණු කිරීම සහ කැමති භාෂාවක් පාවිච්චි  කිරීම;
- ඔබේ අවශ්‍යතාවන්ට සරිලන උසස් ප්‍රමිතියකට අනුකූල සත්කාර ලැබීම;
- පැමිණිලි කිරීම හා ගැටළු නිරාකරණය කර ගැනීම;
- පුද්ගලිකත්වය.

සත්කාර සේවාවන්ට අදාල අයිතීන් සහ වගකීම් පිළිබඳ වැඩුර විස්තර සඳහා දුරකථන අංක 1800 700 600 මගින් (National Aged Care Advocacy Line ) අමතන්න.

**උද්ගත ප්‍රශ්න සහ පැමිණිලි**

ඔබ ලබන සත්කාර සහ සේවාවන්ගේ ප්‍රමිතිය පිළිබඳ උද්ගත ප්‍රශ්න හෝ පැමිණිලි ඇති නම් ඒ පිළිබඳව වැඩිහිටි සත්කාර සේවාවෙහි කළමනාකරු සමග කතා කළ හැකිය. එසේ කිරීම අපහසුයැයි සිතේ නම් හෝ ඔබගේ  පැමිණිල්ල පිළිබඳ කටයුතු කළ ආකාරය පිළිබඳ සෑහීමකට පත්නොවේ නම් දුරකථන අංක 1800 550 552 මගින් (Aged Care Complaints Investigation  Scheme)   ඇමතිය හැක. මෙය රහසිගත සහ නොමිලේ කෙරෙන සේවාවකි.

# ප්‍රයෝජනවත් දුරකථන අංක

දුරකථනයෙන් කථා කිරීමට භාෂණ පරිවර්තකයකු අවශ්‍ය නම් අංක 13 14 50 මගින් පරිවර්තන සහ භාෂණ පරිවර්තන සේවා (Translation and Interpreting Service) අමතන්න.  මෙය ගාස්තු අය නොකෙරෙන සේවාවකි.

ජංගම දුරකථනවලින් හැර අංක 1800 න් පටන්ගන්නා දුරකථන අංක ගාස්තුවලින් නිදහස්ය.

### වැඩිහිටි සත්කාර පැමිණිලි විභාග කිරීමේ වැඩසටහන (Aged Care Complaints Investigation Scheme): 1800 550 552

වැඩිහිටි සත්කාර පැමිණිලි විභාග කිරීමේ වැඩසටහන රජයේ අනුග්‍රහය ලබන ප්‍රජා සත්කාර විවේක සත්කාර සහ නිවාස සත්කාර ඇතුළු වැඩිහිටි සත්කාර සේවවාන් පිළිබඳ පැමිණිලි සහ ප්‍රශ්නගත දෑ විභාග කරයි. ඔබ ලබන සේවාවන් පිළිබඳ ප්‍රශ්න හෝ පැමිණිලි ඇත්නම් වැඩිහිටි සත්කාර පැමිණිලි විභාග කිරීමේ (Aged Care Complaints Investigation Scheme)  වැඩසටහන අමතන්න. පැමිණිලි නිරනාමිකව ඉදිරිපත් කළ හැකිය.  මෙය ගාස්තුවෙන් තොර සේවාවකි.

### වැඩිහිටි සත්කාර තොරතුරු දුරකථන සේවා (Aged Care Information Line): 1800 500 853

වැඩිහිටි සත්කාර තොරතුරු දුරකථන සේවාව මුදල් සහ ගාස්තු ආදායම් පරීක්ෂාව සහ මූල්‍ය ආධාර ඇතුළු වැඩිහිටි සත්කාර පිළිබඳ තොරතුරු සපයයි.

Centrelink - දුබලතා, රෝගී තත්වයන් සහ සත්කාරකයන්:13 27 17 දුබලතා ආධාර විශ්‍රාම වැටුප් ප්‍රවාහන දීමනා, සත්කාරක ගෙවීම්,  සත්කාරක දීමනා, සහ රෝගී දීමනා ඇතුළු තොරතුරු සම්බන්ධයෙන් මේ අංකය අමතන්න.

Centrelink  බහු භාෂා දුරකථන ඇමතුම්  13 12 02
ඔබේ මනාපයන්ට අනුකූල භාෂාවකින් Centerlink සේවා නියුක්තයන් හා කතා කිරීමට මේ අංකය අමතන්න.

**Centrelink විශ්‍රාම සේවා: 13 23 00**

වැඩිහිටි විශ්‍රාමික වැටුප්, විශ්‍රාමික සහන කාඩ්පත රජයේ වැඩිහිටි සුව සෞඛ්‍ය කාඩ්පත සහ නේවාසික සත්කාර මුදල් සඳහා ආදායම් තක්සේරු ඇතුළු විශ්‍රාම තොරතුරු සඳහා මේ අංකය අමතන්න. ප්‍රජාවේ සිටන සියල්ලන්ට (ඔබ විශ්‍රාම වැටුපක් නොලබනවා වුවද) ලබා ගතහැකි නිදහස් සහ ස්වාධීන සේවාවක් වන Centerlink මූල්‍ය තොරතුරු සේවාව ඇමතීමටද මේ අංකය භාවිතා කල හැක.

**රජයේ සුව ක්‍රියාදාම (Commonwealth Carelink Centre) මධ්‍යස්ථානය: 1800 052 222**

රජයේ සුව ක්‍රියාදාම මධ්‍යස්ථානය වැඩිහිටි සත්කාර සේවාවන් පිළිබඳ එක වහලක් යට තොරතුරු ලබාගත හැකි ස්ථානයකි.  ඔබ ප්‍රදේශයේ සහ ඔස්ට්‍රේලියාවෙ ඕනෑම තැනක කාර්යාලයකින් වැඩිහිටි සත්කාර සේවාවන් පිළිබඳව දැනගත හැකිය.  මෙය ගාස්තු වලින් නිදහස් සහ රහසිගත සේවයකි.

**රජයේ සත්කාර විවේක මධ්‍යස්ථානය (Commonwealth Carers’ Respite Centre): 1800 059 059**

රජයේ සත්කාර විවේක මධ්‍යස්ථානය ඔබේ ප්‍රදේශයේ ඇති විවේක සේවාවන් ලබා ගැනීම පිලිබඳව සම්බන්ධීකරණ වැඩකටයුතු, විවේක විකල්පයන් පිළිබඳව, හදිසියේ සැලසුම් කළ විවේකයන් පිළිබඳව සහ කෙටි කාලීන හදිසි විවේකයන් පිළිබඳ තොරතුරු සහ උපදෙස් ලබාදේ. මෙය 24 පැයේ සේවාවකි.

**ජාතික වැඩිහිටි සත්කාර නියෝජන දුරකථන සේවාව: 1800 700 600**

ඔබ පළාතේ නියෝජන සේවා පිලිබඳව තොරතුරු ලබා ගැනිම සඳහා ජාතික වැඩිහිටි සත්කාර නියොජන දුරකථන සේවාව අමතන්න. වැඩිහිටි සත්කාර පිළිබඳ ඔබේ අයිතීන් සහ තීරණ ගැනීමේදී ඔබේ සහාගිත්වය නැංවීමට නියෝජන සේවාවන් උපකාර කරති. මෙකී සේවාවන් පැමිණිලි ක්‍රියාවලියන් හිදී ඔබට සහාය දක්වන අතර වැඩිහිටි සත්කාර සැපයුම් කරුවන් සමග ගනුදෙනු කිරීම සඳහා උපදෙස් ලබා දීමේදී විශේෂ සේවයක් ඉටු කරයි.  මෙය ගාස්තු වලින් නිදහස් සහ රහසිගත සේවාවකි.

**ජාතික චිත්ත වික්ෂේප ආධාර දුරකථන සේවාව (National Dementia Help Line): 1800 100 500**

ජාතික චිත්ත වික්ෂේප ආධාර දුරකථන සේවාව 24 පැයේ පවතින ජාතික දුරකථන සේවයක් වන අතර අල්ට්සයිමර් ඔස්ට්‍රේලියාව- මගින් ක්‍රියාත්මක කෙරෙන සේවාවන්ට ආධාර කරයි.  එය ප්‍රායෝගික තොරතුරු, ආධාර සහ උපදෙස් හා අල්ට්සයිමර් Alzheimer`s ඔස්ට්‍රේලියාව මගින් සලසනු ලබන පුළුල් පරාසයක පවතින සේවා පිළිබඳ තොරතුරු සපයයි.  මෙය ගාස්තු වලින් නිදහස් සහ රහසිගත සේවයකි.

*මේ තොරතුරු වියපත් වීමේ සංස්කෘතික විවිධත්වය සඳහා වන මධ්‍යස්ථාන 2008 මගින් සම්පාදනය කරන ලද්දකි.*